**29-08-2025** **උදෑසන මුරලි** **ඕම් ශාන්ති** **බාප්දාදා** **මධුබන්**

**සාරය:** සුමිහිරි දරුවනි, ඔබගේම ආරක්ෂාව සඳහා, සෑම විටෙකම මායාගේ උල් නිය වලින්, එනම්, අවගුණ වලින් තමාව ආරක්ෂා කරගන්න. කිසිම විටෙක ශරීර අවධානයට පත් නොවන්න.

**ප්‍රශ්නය:** ඔබට පුණ්‍ය ආත්ම බවට පත් වීමට, පියා ඔය සියලුම දරුවන්ට ලබා දෙන ප්‍රධානතම ඉගැන්වීම් මොනවාද?

**පිළිතුර:** බාබා පවසන්නේ : දරුවනි, පුණ්‍ය ආත්ම බවට පත් වීමට: 1) නිරතුරුවම අඛණ්ඩව ශ්‍රීමත් පිළිපදින්න. සිහිපත් කිරීමේ වන්දනාව ගැන කිසිම විටෙක නොසැලකිලිමත් නොවන්න. 2) ජීවාත්ම අවධානයට පත් වී, විශාලතම සතුරා වන රාගය ජය ගැනීමට සම්පූර්ණයෙන් උත්සාහ දරන්න. පුණ්‍ය ආත්මයක් වී, මෙම දුක් දේශය අතහැර, සතුටු ලෝකයට එතෙර වීමේ කාලය මෙයයි.

ඕම් ශාන්ති. ඔය දරුවන්ගෙන් දිනපතා ප්‍රශ්න කරන්නේ පියාය. ශිව බාබාට කුඩා දරුවන් සිටිනවා කියා ඔබ කියන්නේ නැත. ජීවාත්ම සදාකල්හිම පවතී. පියාද සදාකල් පවතී. බාප් සහ දාදා යන දෙදෙනාම සිටින මේ කාලයේ පමණයි, දරුවන්ව රැක බලාගැනීමට සිදුවන්නේ. රැකබලාගත යුතු දරුවන් බොහෝමයක් සිටියි. ඔහු සෑම දරුවෙකුගේම ගිණුමක් තබා ගත යුතුයි. භෞතික පියෙක් සැලකිලිමත් වී, ඔහුගේ දරුවන්ද මෙම බ්‍රහ්මණ වංශයේ කොටසක් වූයේ නම් හොඳ බව සිතන ආකාරයෙන්ම, මටද හැඟෙන්නේ, මගේ දරුවන් පිවිතුරු වී පාරිශුද්ධ ලෝකයට යා යුතු බවයි. මගේ දරුවන් මායාගේ පරණ කාණුව දිගේ ගසාගෙන යනවාට මා අකමැතියි. අසීමිත පියා, දරුවන් ගැන සැලකිලිමත් වනවා. මධ්‍යස්ථාන බොහොමයක් තිබේ. කුමන දරුවන්, ඔවුන්ගේ ආරක්ෂාව වෙනුවෙන් කොතැනට යැවිය යුතුද කියා ඔහු දන්නවා. මේ දිනවල ආරක්ෂිතව සිටීම ඉතාමත්ම අපහසුයි. ලොවෙහි කිසිම ආරක්ෂාවක් නැත. දිව්‍ය ලෝකයේ සෑම කෙනෙක්ම ආරක්ෂිතයි. මෙහි, කිසිම කෙනෙක් ආරක්ෂිත නැහැ. එක් හෝ තව තැනක, ඔවුන් මායාගේ උල් නිය වල, එනම් අවගුණ වල සිර වෙයි. ඔය ජීවාත්ම වලට දැන් මෙම ඉගැන්වීම් ලබා දෙනවා. ඔබට සත්‍යයේ ආශ්‍රය තිබෙන්නේ මෙහිය. ඔබ මෙම දුක් දේශය අතහැර, එතෙර ඇති සතුටු දේශයට යා යුතුයි. දුක් දේශය යනු කුමක්ද, සතුටු දේශය යනු කුමක්ද කියා දැන් ඔය දරුවන්ට වැටහෙනවා. මෙකල, එය සැබවින්ම දුක් දේශයයි. අප මෙහිදී බොහෝ පාපයන් සිදු කර ඇති අතර, අප එහි සිටින විට, පුණ්‍ය ආත්ම වෙයි. අප දැන් පුණ්‍ය ආත්ම විය යුතුයි. ඔය සෑම කෙනෙක්ම දැන් ඔබගේ උපත් 84 හි ඉතිහාසය සහ භූගෝලය ගැන දන්නවා. ලොවෙහි කිසිම කෙනෙක් උපත් 84 හි ඉතිහාසය සහ භූගෝලය ගැන නොදනී. පියා දැන් පැමිණ, ඔබගේ චරිත කතාව ඔබට විස්තර කර දී තිබේ. සිහිපත් කිරීමේ වන්දනා ගමනේ සිටීමෙන් ඔබ සම්පූර්ණ පුණ්‍ය ආත්ම විය යුතු බව, ඔබට දැන් වැටහෙනවා. ඔබ බොහෝ සේ මුලාවට පත් වන්නේ මෙහි වැරදීම් සිදු කිරීමෙන්ය. පියා පවසන්නේ මෙකල වැරදි සිදු කිරීම හොඳ නැත. ඔබ ශ්‍රීමත් පිළිපැදිය යුතුයි. එයින්ද බාබා පවසන ප්‍රධානතම දේ වන්නේ පළමුව සිහිපත් කිරීමේ වන්දනාවේ සිටින්න, දෙවනුව, විශාලතම සතුරා වන රාගය පරාජය කරන්න. ජීවයන්ට ඔවුන්ගේ සාමයේ සහ සතුටේ උරුමය ලැබෙන්නේ ඔහුගෙන් බැවින්, සියලු දෙනාම ඔහුට කන්නලව් කරයි. පෙර කල, ඔබ ශරීර අවධානයෙන් සිටි විට, ඔබ කිසිම දෙයක් දැන සිටියේ නැත. ඔය දරුවන්ව දැන් ජීවාත්ම අවධානයට පත් කරවනවා. අළුත් අයට පළමුවෙන්ම ඔවුන්ගේ සීමිත පියාගේ සහ දෙවනුව අසීමිත පියාගේ හැඳින්වීම ලබා දිය යුතුයි. අසීමිත පියාගෙන් ඔබගේ භාග්‍යය ලෙස ඔබට දිව්‍ය ලෝකය හිමි වනවා. සීමිත පියාගෙන් ඔබගේ භාග්‍යය ලෙස ලැබෙන්නේ අපායයි. දරුවෙක් වැඩෙන විට ඔහුට දේපළ වලට අයිතියක් හිමි වනවා. ඔහුගේ වටහාගැනීම වර්ධනය වන විට, ක්‍රම ක්‍රමයෙන් ඔහු මායාගේ බලපෑමට හසුවනවා. එම චාරිත්‍ර වාරිත්‍ර සියල්ලම අයත් වන්නේ රාවණගේ රාජධානියට, දූෂිත ලෝකයටයි. මෙම ලෝකය දැන් වෙනස් වීමට යන බව ඔය දරුවන් දන්නවා. මෙම පැරණි ලෝකය දැන් විනාශ වීමට යනවා. ගීතාවේ පමණයි විනාශය ගැන සඳහන් වන්නේ. වෙනත් කිසිම ග්‍රන්ථයක මහා භාරත යුද්ධය, මහා යුද්ධය ගැන සඳහනක් නැත. මෙය ගීතාවේ වඩාත්ම ශුභදායක වූ සංගම යුගයයි. ගීතාවේ යුගය යනු, ආදි සනාතන දෙවි දේවතා ධර්මයේ ස්ථාපනයයි. ගීතාව, දේවතා ධර්මයේ ග්‍රන්ථයයි. එබැවින්, මෙය නව ලෝකය ස්ථාපිත වෙන, ගීතාවේ යුගයයි. මනුෂ්‍යයින් පරිවර්ථනය විය යුතුයි ඔවුන් සාමාන්‍ය මනුෂ්‍යයින්ගෙන් දේවතාවන් බවට පරිවර්ථනය විය යුතුයි. දිව්‍යමය ගුණධර්ම ඇති මනුෂ්‍යයින් අනිවාර්යෙන්ම නව ලෝකයට අවශ්‍යයි. ලෝකයේ කිසිම කෙනෙක් මෙම දේවල් දන්නේ නැත. ඔවුන් චක්‍රයේ කාල පරාසය බොහෝ දීර්ඝ කර තිබේ.

පියා ඔය දරුවන්ට දැන් විස්තර කර දෙන අතර, බාබා සැබවින්ම ඔබට උගන්වන බව ඔබට වැටහෙයි. ක්‍රිෂ්ණාට, පියා, ගුරුවරයා හෝ ගුරු කියා කිසිම විටෙක ඇමතිය නොහැක. ක්‍රිෂ්ණා ගුරුවරයා වන්නේ නම්, ඔහු ඉගෙනගත්තේ කාගෙන්ද? ඔහුට දැනුමේ මහා සාගරය යැයි කිව නොහැක. ඔය දරුවන් දැන් වැදගත් මිනිසුන්ට විස්තර කළ යුතුයි. සේවය ව්‍යාප්ත විය හැක්කේ කෙසේද කියා, එකට එකතු වී සාකච්ඡා කරන්න. සේවය වේගවත් විය හැක්කේ කෙසේද? එවිට ඔවුන්ට එරෙහිව බොහෝ අවහිරකම් සිදු කළද, බ්‍රහ්ම කුමාරීන් ඇත්ත වශයෙන්ම නිවැරදි බව ඔවුන්ට වැටහෙයි. ඉතිරි ලෝකයම බොරුවකි, එම නිසයි ඔවුන් සත්‍යයේ ඔරුව දිගින් දිගටම පද්දන්නේ. කුණාටු පැමිණෙනවා, නැද්ද? එතෙරට යන ඔරු ඔබලාය. මෙම මායාවේ ලෝකයෙන් ඔබ එගොඩට යා යුතු බව ඔබට වැටහෙනවා. පළමුවන කුණාටුව, ශරීර අවධානයයි. දරුණුතම කුණාටුව එයයි. සෑම කෙනෙක්ව අපවිත්‍ර කර ඇත්තේ එම අවගුණයයි. මේ නිසයි පියා පවසන්නේ විශාලතම සතුරා වන්නේ රාගයයි. එය බොහෝ බලසම්පන්න කුණාටුවකි. එසේ වුවද ඇතැම් අය එය පරාජය කර තිබේ. තම පවුලේ අය සමඟ නිවෙස් වල වාසය කරන අය, තවමත් තමන්ව ඉන් ආරක්ෂා කරගැනීමට වෑයම් කරනවා. මෙය කුමාර් සහ කුමාරීන්හට ඉතා පහසුයි. මේ නිසයි 'කන්හයියා' (කුමාරීන්ගේ ස්වාමියා) සිහි කර ඇත්තේ. මෙතරම් කුමාරීන් ගණනක් අනිවාර්යයෙන්ම අයත් වන්නට ඇත්තේ ශිව බාබාටයි. ක්‍රිෂ්ණා, ශාරීරික ජීවයක් ඔහුට මෙතරම් කුමාරීන් ගණනක් සිටිය නොහැක. ඔබ දැන් මෙම ඉගෙනුම තුළින් රජිනියන් බවට පත් කෙරෙනවා. මේ සඳහා අවශ්‍ය ප්‍රධානතම දේ වන්නේ පාරිශුද්ධත්වයයි. තමන් දෙස බලා ඔබගේ සිහිපත් කිරීමේ වාර්තාව හොඳ දැයි පරීක්ෂා කරන්න. බාබාට දරුවන්ගේ වාර්තා ලැබෙනවා. ඇතැම් අයට පැය දෙකක හෝ තුනක සිහි කිරීම තිබෙන අතර ඇතැම් අයට පැය පහක් තිබේ. සමහරු එය ලියන්නෙම නැහැ ඔවුන් ඔහුව සිහිපත් කරන්නේ ඉතා අඩුවෙනි. සෑම කෙනෙකුගේම වන්දනාව සමාන විය නොහැක. තව බොහෝ දරුවන් එන්නට සිටිනවා. ඔබ සෑම කෙනෙක්ම තම වාර්තාව පරීක්ෂා කර බලා, ඔබට කොපමණ ප්‍රමාණයකට තත්ත්වයක් හිමි කරගැනීමට හැකි වෙයිද කියා බැලිය යුතුයි. එම සතුට, ඔබට කොපමණ ප්‍රමාණයකට තිබේද? ඔබ දැන් උසස්ම-උසස් පියාට අයත් බැවින්, ඔබ නිරන්තරයෙන් සතුටින් නොසිටින්නේ ඇයි? නාටකයට අනුව, ඔබ බොහෝ භක්තිය කර තිබේ. බැතිමතුන්ට ඔවුන්ගේ ඵලය ලබා දීමට, පියා දැන් පැමිණ තිබේ. රාවණාගේ රාජධානියේ දිගින් දිගටම පාප ක්‍රියා සිදුවනවා. ඔබ සතෝප්‍රධාන් ලෝකයට යෑමට උත්සාහ දරමින් සිටිනවා. සම්පූර්ණ උත්සාහ නොදරන අය, සතෝ තත්ත්වයට යයි. සෑම කෙනෙක්ම එතරම් දැනුම ලබා ගන්නේ නැත. ඔවුන් කොහේ සිටියත්, සෑම කෙනෙකුටම අනිවාර්යයෙන්ම පණිවුඩය ලැබිය යුතුයි. ඒ නිසයි ඔබ සෑම කොණකටම යා යුත්තේ. මෙම දූත මෙහෙය විදේශයන්ටද යා යුතුයි. වෙනත් ආගම් වල අය, ඔවුන්ගේ ආගමට හරවා ගැනීමට පැමිණෙන, බෞද්ධයින්ගේ සහ ක්‍රිස්තියානුවන්ගේ දූත මෙහෙයන් තිබේ. අප මුලින්ම දේවතා ධර්මයට අයත්ව සිටි බවත් අප දැන් අයත් වන්නේ හින්දු ආගමට බවත් ඔබ පහදා දෙයි. සාමාන්‍යයෙන්, හින්දු ආගමේ අය, ඔබ වෙතට එයි. ඔවුන් අතරින්ද, ශිවාව වන්දනා කරන අය සහ දේවතාවන්ව වන්දනා කරන අයයි පැමිණෙන්නේ. රජවරුන්ට සේවය කරන්න කියා, බාබා ඔබට කියා තිබේ. ඔවුන්ගෙන් වැඩි දෙනෙක් දේවතාවන් වන්දනා කරන්නන්ය. ඔවුන්ගේ නිවෙස් වල දේවාල තිබේ. ඔබ ඔවුන්ටත් සෙත සැලසිය යුතුයි. ඔබ දුර ඈත දේශයේ සිට, පියා සමඟ මෙහි පැමිණ ඇති බව සලකන්න. පියා පැමිණ ඇත්තේ නව ලෝකය ස්ථාපිත කිරීමටයි. ඔබත් එය කරනවා. එය ස්ථාපනය කරන අය, එය පෝෂණයද කරයි. ඔබ ශිව බාබා සමඟ මෙහි පැමිණ ඇත්තේ, දේවතා ධර්මය ස්ථාපනය කිරීමට සහ මුළු ලෝකයම දිව්‍ය ලෝකය බවට පත් කිරීමටයි, යන කුල්මත්භාවය ඔබ තුළ තිබිය යුතුයි. මේ ලෝකයේ මිනිසුන් දිගින් දිගටම කරන දේවල් ගැන කෙනෙක් පුදුමයට පත්වනවා! ඔවුන් වන්දනා කරන ආකාරය බලන්න! දේවතාවියන්ගේ නවරාත්‍රී උත්සව කාලයේදී ඔවුන් දේවතාවියන්ව වන්දනා කරයි. රාත්‍රිය තිබෙන බැවින්, දහවලද තිබිය යුතුයි. ඔබට මෙවැනි ගීතයක් තිබේ, 'ඔබ දුටු පුදුමය කුමක්ද?' ඔවුන් මැටි පිළිම සාදා, ඒවා සරසා, ඉන්පසුව ඒවාට වන්දනා කරයි. එම පිළිම වලට ඔවුන්ගේ හදවත් බොහෝ බැඳෙන බැවින්, ඒවා ජලයේ ගිල්වීමට යන විට ඔවුන් වැලපෙයි. කෙනෙක් මිය ගිය විට, ඔවුන් එම මළසිරුර ගඟට ගෙන ගොස්, දෙවියන්ගේ නාමය ජප කරමින් එය ගිල්වා දමයි. බොහෝ දෙනෙක් එහි යයි. එම ගංඟාවන් සදාකල්හි පවතී. එම නැටුම් ආදිය සිදු වූයේ යමුනා ගංතෙර අසල බව ඔබ දන්නවා. එහි විශාල මාලිගා තිබෙයි. ඔබ එහි ගොස් ඒවා ගොඩනගයි. කෙනෙක් වැදගත් විභාගයක් සමත් වීමට යන විට, එම විභාගය සමත් වූ පසු, ඔහු නිවසක් ආදිය තනන ආකාරය ගැන ඔහුගේ බුද්ධිය සැලසුම් සාදයි. ඔය දරුවන්ද, ඔබ දේවතාවන් වන බව, ඔබ දැන් ඔබගේ නව නිවසට යෑමට තිබෙන බව අවධානයේ තබා ගත යුතුයි. ඔබගේ නිවස සිහිපත් කරමින් ඔබ සතුටු විය යුතුයි. කෙනෙක් සංචාරයකින් පසුව ආපසු පැමිණෙන විට, ඔහු උපත ලද ස්ථානයට ආපසු යෑම ගැන බොහෝ සතුටට පත් වෙයි. ඔය ජීවාත්මයන්ගේ නිවහන අශාරීරික ලෝකයයි. බොහෝ සතුට තිබේ!

මනුෂ්‍යයන් විමුක්තිය ලබාගැනීමට බොහෝ සේ භක්තියේ යෙදෙයි. කෙසේවෙතත්, දැනට ආපසු නිවසට යාමට හැකි චරිත කොටසක් කිසිවෙකුට නාටකයේ නොමැත. ඔවුන් අනිවාර්යෙන්ම චක්‍රයෙන් භාගයක් ඔවුන්ගේ චරිත කොටස් රඟ පෑ යුතු බව ඔබ දන්නවා. අපගේ උපත් 84 දැන් අවසන් වනවා. අප දැන් ආපසු නිවසට යා යුතු අතර, ඉන්පසුව අප අපගේ රාජධානියට ඇතුළු වනවා. ඔබගේ නිවහන සහ රාජධානිය සිහිපත් කරන්න, එපමණයි. මෙතැන අසුන් ගෙන සිටින අතර, ඇතැම් අයට ඔවුන්ගේ කර්මාන්තශාලා මතක් වෙයි. නිදසුනක් ලෙස, බිර්ලා දෙස බලන්න! ඔහුට බොහෝ කම්හල් තිබේ. ඔහු දවස පුරාම ඒවා ගැන සැලකිලිමත් වෙයි. ඔහුට බාබාව සිහිපත් කරන්නට කියා ඔබ කීවොත්, ඔහුට බොහෝ බාධක තිබෙයි. ඔහුට නැවත නැවතත් ඔහුගේ ව්‍යාපාරය සිහි වෙයි. මව්වරුන්ට එය පහසු අතර, කුමාරීන්ට ඊටත් වඩා පහසුයි. ජීවමාන මරණයක් මියගොස්, මුළු ලෝකයම අමතක කරදමන්න! ඔබ තමන් ජීවාත්මයක් බව සහ ශිව බාබාට අයත් බව සලකන විට, එයට ජීවමානව මියැදීම යැයි කියයි. ශරීරය සහ සියලුම ශාරීරික නෑදෑයින් අත්හරින්න! තමන් ජීවාත්මයක් බව සළකා, ශිව බාබාට අයිති වන්න! අඛණ්ඩව ශිව බාබාව සිහි කරන්න, මන්ද ඔබගේ හිස මත විශාල පාප බරක් ඇත. සෑම කෙනෙක් තුළම, ජීවමානව මියැදී, ශිව බාබාට අයත් වීමේ ආශාව තිබේ. ශරීරය පිළිබඳ අවධානයක් නොතිබිය යුතුයි. අප අශාරීරිකව පැමිණි අතර, අප අශාරීරිකව ආපසු යා යුතුයි. අප දැන් පියාට අයත්ය. එබැවින් අප පියා හැර අන් කිසිවෙකු සිහි නොකළ යුතුයි. එය විගසින් සිදුවන්නේ නම්, යුද්ධයද විගසින් සිදුවනවා ඇති. අප ඔහුට අයත් බව ශිව බාබා අපට බොහෝ වාර ගණනාවක් කියයි. අප එම ස්ථානයේ වැසියන්ය. මෙහි බොහෝ දුක තිබේ. මෙය දැන් අවසන් උපතයි. ඔබ සතෝප්‍රධාන් වූ විට, වෙනත් කිසිවෙකු නොසිටි බව පියා ඔබට කියා තිබේ. ඔබ බොහෝ ධනවත් විය. මෙකල මුදල්, සිප්පි කටු මෙනි. එහි කිසි වටිනාකමක් නැත, සිප්පි කටු පමණයි. ඒ සියලු දේ තාවකාලික සතුට සඳහාය. අතීතයේදී ඔබ බොහෝ දන් දී බොහෝ පුණ්‍ය ක්‍රියා සිදු කළ විට, ඔබට බොහෝ ධනය ලැබුණු බවත්, ඔබ එයත් දන් දුන් බව, පියා ඔබට කියා තිබේ. කෙසේවෙතත්, එය එක් උපතක් සඳහා පමණයි. මෙහි ඔබ උපත් බොහොමයක් ධනවත් වෙයි. මෙහි, කෙනෙක් වැඩියෙන් වැදගත් වන තරමට, වැඩියෙන් දුක තිබේ. බොහෝ ධනය ඇති අය, විශාල වශයෙන් සිරවී සිටියි. ඔවුන්ට කිසිම විටෙක පැමිණ, මෙහි සිටිය නොහැක. සාමාන්‍ය දුප්පත් අය පමණයි, තමන්ව කැප කරන්නේ. ධනවත් අය කිසි විටෙක එසේ කරන්නේ නැත. ඔවුන් උපයන ධනය, ඔවුන්ගේ වංශය පවත්වාගැනීම සඳහා, ඔවුන්ගේ මුනුපුරන් වෙනුවෙනි. ඔවුන් එම නිවෙස් වලටම පැමිණෙන්නේ නැත. බොහෝ දන් දී ඇති අය, රජවරුන් වන්නා සේ, පෙර යහපත් ක්‍රියා සිදු කර ඇති මුනුපුරන්, පැමිණෙයි. කෙසේවෙතත්, ඔවුන් සදා නිරෝගී නැත. ඉතිං ඔවුන් රාජධානියක් පාලනය කළත් ඇති ඵලය කුමක්ද! ඒ වුවත් ඔවුන්ට අවිනාශී සතුට නොමැත. මෙහි සෑම පියවරකදීම බොහෝ විවිධ මාදිලියේ දුක තිබේ. එහි, මේ සියලුම දුක් ඉවත් කර තිබේ. මිනිසුන් පියාට යදින්නේ 'අපගේ දුක නැති කරන්න!' ඔබගේ සියලුම දුක් ඉවත් කෙරෙන බව ඔබ දන්නවා. දිගින් දිගටම පියාව සිහිපත් කරන්න එපමණයි. ඔබට මෙම උරුමය, ඒකායන පියා හැර අන් කිසිවෙකුගෙන් ලබාගත නොහැක. පියා මුළු ලොවෙහිම සියලු දුක් ඉවත් කරදමයි. මෙකල සතුන් පවා බොහෝ දුක් අත්විඳියි. මෙය දුක් ලෝකයයි. දුක එන්න එන්නම වැඩිවන අතර, ජීවාත්ම එන්න එන්නම තමෝප්‍රධාන් වනවා. අප දැන් සංගම යුගයේ සිටින අතර අන් සෑම කෙනෙක්ම සිටින්නේ කලි යුගයේය. මෙය වඩාත්ම උසස්වූ සංගම යුගයයි. බාබා අපව ශ්‍රේෂ්ඨතම මනුෂ්‍යයින් බවට පත් කරවනවා. මෙපමණක් හෝ සිහියේ තබාගැනීමෙන් ඔබට සතුටින් සිටිය හැක. දෙවියන් අපට උගන්වා, අපව ලෝකයේ අධිපතියන් බවට පත් කරවනවා. අඩු තරමින් මෙපමණක්වත් සිහියේ තබා ගන්න! ඔහුගේ ඉගැන්වීම් හැදෑරීමෙන්, ඔහුගේ දරුවන්, දේවතාවියන් සහ දේවතාවන් බවට පත් විය යුතුයි නේද? දෙවියන් සතුට පිරිනමන්නාය. එසේ නම් ඔබට දුක ලැබෙන්නේ කෙසේද? පියා මෙතැන අසුන් ගෙන මෙය විස්තර කර දෙයි. දෙවියන්ගේ දරුවන් දුක අත්විඳින්නේ ඇයි? දෙවියන්, දුක නැති කර, සතුට පිරිනමන්නාය. මිනිසුන් අනිවාර්යෙන්ම දුක් විඳිනවා ඇති, ඒ නිසයි ඔවුන් මෙම ප්‍රශංසාව ගයන්නේ. පියා ඔබට රාජයෝගාව උගන්වන බව ඔබ දන්නවා. ඔබ උත්සාහ දරමින් සිටිනවා. මේ ගැන කිසිම සැකයක් තිබිය නොහැක. බ්‍රහ්ම කුමර කුමරියන් වන ඔබ, රාජයෝගාව ඉගෙනගන්නවා. ඔබ මුසාවක් කියනවා නොවෙයි. කෙනෙකුට සැකයක් තිබෙන විට, මෙය ඉගෙනුමක් බව ඔහුට පහදා දෙන්න. විනාශය ඔබ ඉදිරියේ ඇත. අප බ්‍රහ්මණයින්, සංගම යුගයේ මුදුන් මල්කඩයි. ප්‍රජාපිතා බ්‍රහ්මා සිටින්නේ මෙහිය. එබැවින් මෙහි අනිවාර්යෙන්ම බ්‍රහ්මණයන්ද සිටියි. මෙයද ඔබට විස්තර කර දී තිබේ, මේ නිසයි ඔබට විශ්වාසය තිබෙන්නේ. කෙසේවෙතත්, ප්‍රධානතම දෙය වන්නේ සිහිපත් කිරීමේ වන්දනාව වන අතර, බාධක තිබෙන්නේ මෙහිය. දිගින් දිගටම ඔබගේ වාර්තාව පරීක්ෂා කර බලන්න ඔබ කොතෙක් දුරට බාබාව සිහිපත් කරනවාද, එමෙන්ම කොපමණ ප්‍රමාණයකට ඔබගේ සතුටේ රසදිය කඳ ඉහළ නඟින්නේද කියා. පාරිශුද්ධකරුවා, උයනේ පාලකයාගේ

හස්තය ඔබ දැන් අල්ලාගෙන සිටීම ගැන, ඔබ ඇතුලතින් සතුටු විය යුතුයි. ඔබ බ්‍රහ්ම බාබාගේ මාර්ගයෙන්, ශිව බාබාට අතට අත දෙයි. අච්චා.

සුමිහිරි, ආදරණීය, බොහෝ කලක් නැති වී සිට දැන් හමු වුණ දරුවන්ට ඔබගේ මව, පියා, බාප්දාදා සෙනෙහසින් සිහිපත් කර සුබ උදෑසනක් ප්‍රාර්ථනා කරයි. ආධ්‍යාත්මික පියාගෙන් ආධ්‍යාත්මික දරුවන්ට නමස්කාර.

**ධාරණය සඳහා සාරාංශය:**

1. ඔබගේ නිවහන සහ රාජධානිය සිහි කර, අසීමිත සතුට පවත්වා ගන්න. ඔබගේ ගමන දැන් අවසානයකට පැමිණෙන බව සෑම විටෙකම මතක තබා ගන්න. අපට දැන් නිවහනට යාමට ඇති අතර ඉන්පසු අපි අපගේ රාජධානියට ආපසු යයි.
2. ඔබ බ්‍රහ්ම බාබා මාර්ගයෙන් ශිව බාබාට අතට අත දෙයි. එම, උයනේ අධිපති, ඔබව අපවිත්‍ර බවින් පිවිතුරු කරවනවා. මෙම ඉගෙනුම තුළින්, ඔබ දිව්‍යලෝකයේ රැජිනියන් බවට පත් වනවා. මෙම සතුට ඔබගේ ඇතුලාන්තයේ තබාගන්න.

**වරදානය:** ඔබ නිරන්තරයෙන් ජයග්‍රාහී වී ජයග්‍රාහී පදක්කම් තුනක් ලබා ගනිත්වා.
ජයග්‍රාහී ජපමාලයේ අංකයක් ලබා ගැනීම සඳහා, පළමුවෙන්ම, ඔබ කෙරෙහි ජයග්‍රාහී වන්න, පසුව අනෙක් සියල්ලන් කෙරෙහි ජයග්‍රාහී වී පසුව පදාර්ථයට එරෙහිව ජය ලබන්න. ඔබ මෙම පදක්කම් තුන ලබා ගත් පසු, ඔබට ජයග්‍රාහී ජපමාලයේ පබළු බවට පත්වීමට හැකි වනු ඇත. ඔබ කෙරෙහි ජයග්‍රහණය ලබා ගැනීම යනු ඔබේ උසස් අභිප්‍රායන් සහ සුබ පැතුම් සමඟ ඔබේ නිෂ්ඵල අභිප්‍රායන් සහ ස්වභාවය පරිවර්තනය කිරීමයි. මේ ආකාරයෙන් තමන් කෙරෙහි ජයග්‍රාහී වන අයට අන් අය මත ජයග්‍රාහී වීමට ද හැකි වෙයි. පදාර්ථයට එරෙහිව ජයග්‍රහණය ලබා ගැනීම යනු භෞතික පදාර්ථයේ වාතාවරණය, කම්පන සහ ගැටළු වලට විජයග්‍රාහී වීමයි.

**පාඨය:** තම භෞතික ඉන්ද්‍රියන් සම්පූර්ණයෙන්ම පාලනය කරන අය සැබෑ රාජයෝගීන් වේ.

***** ඕම් ශාන්ති *****

**අව්‍යක්ත සංඥාව: සහජ යෝගීවරයෙක් වීම සඳහා, පරමාත්ම දෙවියන්ගේ සෙනෙහසේ අත්දැකීම් ලබන්න.**

මෙම දැනුම සමඟ, ඔබ දරුවන් සැබෑ ආධ්‍යාත්මික සෙනෙහස ද ලබා ඇති අතර, ඔබව පරමාත්ම දෙවියන්ට අයිතිකර ඇත්තේ මෙම ආධ්‍යාත්මික සෙනෙහසයි. සෑම දරුවෙකුටම ද්විත්ව සෙනෙහසක් ලැබේ: පළමුව, පරමාත්ම පියාගෙන් සහ දෙවනුව, දිව්‍ය පවුලෙන්. සෙනහසේ අත්දැකීම ඔබව සැබෑ සලබයන් බවට පත්කර ඇත. මෙම සෙනෙහස ජීවාත්මයන්ට, සවන්දීමට සහ මිය යාමට සූදානම් කරවන චුම්භකයක් මෙන් ක්‍රියා කරයි. සංගම යුගයේදී ජීව මරණයට පත්වන දරුවන් දෙව් ලොවට යයි.